# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2254/36 – 2021 නොවැම්බර් 18 වැනි බ්‍රහස්පතින්දා – 2021.11.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

33 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය: DS/GFG/L&L/02/2009/02.

ගාල්ල දිස්ත්‍රික්කයේ, කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් අයි. හිමාලි රත්නවීර වන මා විසින් ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 33 වැනි වගන්තිය යටතේ පහත සඳහන් උපලේඛනයේ විස්තර කරන ඉඩම අත්කර ගැනීම සඳහා නියමිත වන්දි මුදල වන රුපියල් දහස (රු. 1,000) අයිතිකරුවන්ට ලබා ගැනීම පිණිස ගාල්ල දිස්ත්‍රික් අධිකරණයේ නඩු අංක LA 719 යටතේ බැර කර ඇති බව මෙයින් දන්වමි.

අයි. හිමාලි රත්නවීර,
ප්‍රාදේශීය ලේකම්,
ගාල්ල - කඩවත් සතර.

2021 නොවැම්බර් මස 15 වැනි දින.

### උපලේඛනය

| | |
|---|---|
| ඉඩමේ නම | : ඔරොප්පුවත්ත මාවත කැබැල්ල |
| පිඹුරු අංකය | : මු.පි.ගා. 4198 |
| කැබලි අංකය | : 01 |
| ප්‍රමාණය | : හෙක්. 0.0524 |
| පිහිටීම | : |

| | |
|---|---|
| උතුරට | : තුසිතා වික්‍රමසිංහ හිමිකම් කියන පෙට්ටිගලවත්ත තුන්වන හරස් පාරේ වරිපනම් අංක 26/2 දරන ඉඩම මාර්ගය සහ පෙට්ටිගල වත්ත, තුන්වන හරස් පාර |
| නැගෙනහිරට | : පෙට්ටිගලවත්ත තුන්වන හරස් පාර සහ මාතර පාර |
| දකුණට | : මාතර පාර සහ සීමාසහිත ඒ. පරණගම සහ පුත්‍රයෝ හිමිකම් කියන මාතර පාරේ වරිපනම් අංක 7 දරන ඉඩම |
| බටහිරට | : සීමාසහිත ඒ. පරණගම සහ පුත්‍රයෝ හිමිකම් කියන මාතර පාරේ වරිපනම් අංක 7 දරන ඉඩම සහ තුසිතා වික්‍රමසිංහ හිමිකම් කියන පෙට්ටිගලවත්ත තුන්වන හරස් පාරේ වරිපනම් අංක 26/2 දරන ඉඩම. |

11-799

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 33 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ යොමු අංකය: KDS/KGK/4/9/2017/01/LA.
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යංශයේ යොමු අංකය: 4-3/11/2016/UD/521.

මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර කඩවත්සතර හා ගඟවටකෝරළේ ප්‍රාදේශීය ලේකම් උයන්වත්තේ ජයසිංහ මුදියන්සේලාගේ සම්පත් සුමන බණ්ඩාර ජයසිංහ වන මා විසින් ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 33 වැනි වගන්තිය යටතේ පහත සඳහන් උපලේඛනයේ විස්තර කරන ලද ඉඩම මහනුවර බහු ආකෘතික මඟී ප්‍රවාහන බස් පර්යන්තයෙහි ඉදිකිරීම් කටයුතු සඳහා රජයට අත්කරගෙන ඇත. එම ඉඩමෙහි අයිතිය තහවුරු කිරීමට නොහැකි බැවින් අත්කර ගැනීමේ පනතේ ප්‍රකාර එයට හිමි වන්දි මුදලේ නාමික තක්සේරු මුදල මහනුවර දිසා අධිකරණයේ උපලේඛනයේ දැක්වෙන නඩු අංකයට බැරකර ඇති බව මෙයින් දන්වා සිටිමි.

යූ.ජේ.එම්.එස්.එස්.බී. ජයසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ.

2021 නොවැම්බර් මස 09 වැනි දින.

#### උපලේඛනය

| | | |
|---|---|---|
| මූලික පිඹුරු අංකය | : | මූ.පි.මහ 6891 |
| කැබලි අංකය | : | 02 |
| ඉඩමේ නම | : | වරිපනම් අංක 274/4, එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මාවත |
| ප්‍රමාණය | : | හෙක්. 0.0037 |
| වන්දි මුදල | : | රු.1000.00 (රුපියල් දහසක් පමණි) |
| දිසා අධිකරණයේ නම | : | මහනුවර |
| නඩු අංකය | : | DLA 11/20 |

11 – 800

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.